# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1648 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 28/10/2024<br>පැය 1420 |

## මාධ්‍ය නිවේදනය

### ශ්‍රී ලංකා රාජ්‍ය සේවා මළල ක්‍රීඩා උළෙල සමස්ථ ශූරතාවයය දිනා ගැනීම - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.

ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ක්‍රීඩා සංගමය මඟින් 20 වන වරටත් සංවිධානය කරන ලද 2024 රාජ්‍ය සේවා මළල ක්‍රීඩා උළෙල 2024 ඔක්තෝම්බර් මස 23 සහ 24 දින වලදී දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේදී උත්කර්ෂවත් අන්දමින් පවත් වන ලදි. මෙම ක්‍රීඩා උළෙල සඳහා රාජ්‍ය සේවා ආයතන 30 කින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 1500 ක් පමණ සහභාගී විය. ශ්‍රී ලංකා පොලිසිය නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 278 දෙනෙකු මෙම තරඟ ඉසව් සඳහා සහභාගී වූ අතර ඔවුන් විසින්,

- රන් පදක්කම් - 64
- රිදී පදක්කම් - 43
- ලෝකඩ පදක්කම් - 36ක් සමඟ

ලකුණු 486ක් ලබා ගන්නා ලදි. ඒ අනුව සමස්ථ පිරිමි ශූරතාවය සහ සමස්ථ කාන්තා ශූරතාවයද සමඟින් කුසලාන 09ක් සමඟ ශ්‍රී ලංකා පොලිසිය විසින් මෙම ක්‍රීඩා උළෙලේ සමස්ථ ශූරතාවය දිනා ගැනීමට සමත් විය .

මෙම තරඟාවලියේ

- වයස අවුරුදු 31-40 වයස් කාණ්ඩයේ දක්ෂතම ක්‍රීඩකයා - ටී.ජී.එස්. විජේතුංග
- වයස අවුරුදු 31-40 වයස් කාණ්ඩයේ දක්ෂතම ක්‍රීඩිකාව - කේ.එන්.පී .කේ. ඒකනායක
- වයස අවුරුදු 41-50 වයස් කාණ්ඩයේ දක්ෂතම ක්‍රීඩකයා - ආර්.එම්.සී. සරත් කුමාර
- වයස අවුරුදු 41-50 වයස් කාණ්ඩයේ දක්ෂතම ක්‍රීඩිකාව - බී.ජී.එස්. හර්ෂණී ජයකාන්ත
- වයස අවුරුදු 51-60 වයස් කාණ්ඩයේ දක්ෂතම ක්‍රීඩකයා - එච් හර්ෂ ප්‍රසාද්

යන ක්‍රීඩකයින් විසින් සම්මාන දිනා ගන්නා ලදි.

ශ්‍රී ලංකා පොලිස් මළල ක්‍රීඩා කණ්ඩායමේ සභාපති ලෙස නියෝජ්‍ය පොලිස්පති මහින්ද දිසානායක මහතා කටයුතු කරන අතර ලේකම් ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සුගත් ගලගමගේ මහතා , පුහුණුකරු ලෙස ප්‍රධාන පොලිස් පරීක්ෂක හර්ෂ ගමගේ, කළමණාකරු ලෙස උප පොලිස් පරීක්ෂක වික්‍රමගේ යන මහත්වරුන් කටයුතු කරනු ලබයි.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්**







පොලිස් මාධ්‍ය කොට්ඨාසය.